


# 23

# නුබුව්වත් හා මිඃරාජ්

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා විවාහ වීමත් සමග පවුල හා සමාජය පිළිබඳ එතුමාගේ හැඟීම් වර්ධනය විය. හජ්රුල් අස්වද් නම් ගල කඃබාවේ රැඳවූ සිදුවීමට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා දුන් සහාය හේතුවෙන් එතුමා පිළිබඳ ව වූ ගරුත්වය තවත් ශක්තිමත් විය. එවකට එම සමාජය තුළ දක්නට ලැබුණු වැරැදි දේව විශ්වාස හා ක්‍රියා පිළිබඳ ව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පසුතැවුණහ. මෙම අවස්ථාවේ දී එතුමා තම සීයා වූ අබ්දුල් මුත්තලිෆ් තුමාගේ සම්ප්‍රදය පිළිපදිමින් හිරා ගුහාවේ හුදෙකලා ව සිටින්නට පටන් ගත්තේ ය.



හිරා ගුහාව

## නුබුව්වත්

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එවකට රමළාන් මස අග භාගයේ දී හිරා ගුහාවේ දීර්ඝ කාලයක් භාවනාවේ නියැළී සිටියහ. එවිට ජිබ්රීල් අලෛහිස්සලාම් තුමා එකවර ම දිස් වී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා තදින් වැළඳ ගෙන "ඉක්රඃ" (කියවන්න) යැයි පැවසූහ. උම්මි නබි තුමාණෝ තමන්, "කියවන්න නොදනිමි" යැයි සත්‍ය පැවසූහ. දෙවන වරටත් වැළඳ ගෙන "ඉක්රඃ" යැයි පැවසූ විටත් එම පිළිතුර ම නැවත පැවසූහ. තෙවන වරටත් වැළඳ ගෙන "ඉක්රඃ" යැයි පැවසූ විට "කුමක් පවසම් ද?" යි විමසූහ. එවිට,




**(නබි මුහම්මද් සියල්ල) මැවුවා වූ නුඹගේ පරමාධිපතිගේ නාමයෙන් පාරායනා කරනු. කැටි ගැසුණු රුධිර පිඬකින් ඔහු මිනිසාව මැව්වේ ය. (නබි මුහම්මද්) පාරායනා කරනු. තවද නුඹගේ පරමාධිපතියාණන් ඉතා උදර ය. ඔහු පන්හිඳ මගින් ඉගැන්නුවේ ය. මිනිසාට ඔහු නොදත් දේ ඉගැන්වූයේ. (96 : 15)**

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා එය පැවසූ විගස එය එතුමාගේ සිතෙහි තැන්පත් විය.

මෙය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට නව අත්දැකීමක් විය. එම නිසා එතුමාණෝ තිගැස්සුණහ. එතුමාගේ ශරීරය බියෙන් වෙව්ලන්නට විය. පසුව නිවසට ගියහ. බිරිඳ කදීජා රළියල්ලාහු අන්හා තුමියට "මාව පොරවන්න. මාව පොරවන්න" යැයි පවසා ඇය ඉක්මන් කළහ. කදීජා රළියල්ලාහු අන්හාතුමිය එතුමා පොරවා සනසා සන්සුන් කළා ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ටික වෙලාවකට පසු සන්සුන් වී හිරා ගුහාවේ සිදු වූ සිදුවීම් මාලාව පැවසුවේ ය.

බිරිඳ කදීජා රළියල්ලාහු අන්හා තුමිය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ යහගුණ පෙන්වා දී එතුමා සැනසුවා ය. පසුව තම ඥාතියෙකු වූ පෙර ආගම් අධ්‍යයනය කළ වරකා බින් නව්ෆල් තුමා වෙත එතුමා කැඳවා ගෙන ගියා ය.

හිරා ගුහාවේ තමන්ට සිදු වූ සියල්ල නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. එයට නිහඬ ව සවන් දීමෙන් පසු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ් තමන්ගේ ධර්ම දූතයා ලෙස පත් කර ඇති බවත් එතුමා සමීපයට පැමිණියේ මූසා අලෛහිස් සලාම් තුමා සමීපයට පැමිණි **"නාමූසුල් අඃලම්"** යන ජිබ්රීල් අලෛහිස්සලාම් යන්නත් පැහැදිලි කළේ ය. එසේ ම අනාවැකි කිහිපයක් ද ප්‍රකාශ කළේ ය.

කදීජා රළියල්ලාහු අන්හා තම සැමියා "නබි" ලෙස ප්‍රථම වරට පිළිගෙන සැම අතින් ම සැමියාට ශක්තියක් වී උදවු කළා ය. ඉන්පසු තරුණ කාලයේ මිතුරෙකු වූ අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා ද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ නිවසේ වාසය කළ නිදහස ලැබූ වහලෙකු වූ සෙයිද් බින් හාරිසා රළියල්ලාහු අන්හා තුමිය ද, කුඩා දරුවෙකු වූ අලි රළියල්ලාහු අන්හු තුමා ද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා නබිවරයෙකු ලෙස පිළිගත්හ. පසුව අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාට ද තවත් බොහෝ දෙනෙකුට ද ඉස්ලාමය වැළඳ ගැනීමට සැලැස්සුවේ ය.

ඉන් පසු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ තම ඥාතීන් සංග්‍රහයකට කැඳවා දේව පණිවිඩය දනුම් දුන් අතර ඔවුන්ගේ සහයෝගය ද බලාපොරොත්තු වූහ. නමුදු එහි දී සහයෝගයට වඩා විරෝධතාවයක් ගොඩනැගිනි. අබුලහබ්ගේ නායකත්වය යටතේ විරෝධතා එල්ල විය. නමුත් එයින් නොනැවතුණු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පළමු ව තම ප්‍රචාරය රහසිගතව දියත් කළහ. පසුව සෆා කඳු මුදුනට නැග හඬ නගා සැම ගෝත්‍රයකට ම අයත් අය කැඳවා තම දේව පණිවිඩය දනුම් දුන්හ. එහිදීත් ඔවුන් කර විරුද්ධත්වය ප්‍රකාශ වුණි. නමුදු, එතුමාණෝ තම ප්‍රචාරය අත් නොහැරියහ. එතුමාණෝ අභියෝග මධ්‍යයේ රහසිගත ව හා ප්‍රසිද්ධියේ තම කාර්යභාරය ඉටු කිරීමට උත්සාහ ගත්හ. එම අවස්ථාවන්හි දී ඇති වූ ශාරීරික, මානසික, සමාජීය වශයෙන් සිදු වූ සියලු බලපෑම් ඉවසා දරා ගත්හ.

## අල් ඉස්රා හා අල් මිඃරාජ්




එකම රාත්‍රියක් තුළ තම ගැත්තාව ඔහුට අපගේ සංඥාවන් පෙන්වීම සඳහා (මක්කාවේ) මස්ජිදුල් හරාමයේ සිට එහි වටපිටාව අප විසින් ම ආශිර්වාද කර තිබුණු (යෙරුසලමේ) මස්ජිදුල් අක්සා (දුරබැහැර දෙව්මැදුර) දක්වා රාත්‍රි කාලයේ ගෙන ගිය ඔහු (අල්ලාහ්) ඉඳුරා සුවිශුද්ධ ය. නියත වශයෙන් ඔහු සර්ව ශ්‍රාව්‍ය ය. සර්ව දෘෂ්ටික ය. (17 : 01)

අබූතාලිබ්, කදීජා රළියල්ලාහු අන්හා තුමිය යන අයගේ අභාවය, තායිෆ් නගරයේ දී මුහුණු දුන් අමිහිරි අත්දැකීම්, ජනතාව එතුමාට තුවාල සිදු කිරීම මුල් කොට ගෙන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා දැඩි ශෝකයෙන් පසුවිය. අල්ලාහ්, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සැනසීමටත් කරුණු කිහිපයක් එතුමාට සජීවී ව පෙන්වා දීමටත් සිතුවේ ය. එම නිසා අල් අක්සා දේවස්ථානයට රාත්‍රී ගමන ද (අල් ඉස්රා) අහස් අතරින් දෙව්ලොව ගමන ද (අල් මිඃරාජ්) සූදනම් කර දුන්නේ ය.

මෙම සුවිශේෂි සිදුවීම නුබුව්වත් 12 වන වසරේ රජබ් මස 27 වන දින රාත්‍රියේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ 52 වයසේ සිදු විය. එම රාත්‍රියේ දී ජිබ්රීල් අලයිහිස් සලාම් තුමා පැමිණ, නිද සිටි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අවදි කළේ ය.

එතුමාගේ හදවත පිරිසිදු කළේ ය. "බුරාක්" නැමති රථයට නංවා මස්ජිදුල් හරම්හි (මක්කා) සිට මස්ජිදුල් අක්සාවට (ජෙරුසලම්) කැඳවා ගෙන ගියේ ය. ගමනේ දී දර්ශන කිහිපයක් පෙන්වන ලදි. මෙලොව ජීවිතයේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල එම දර්ශන තුළින් පෙනෙන ලෙස සකස් වී තිබුණි. මස්ජිදුල් අක්සාවෙහි කුලුනක "බුරාක්" ගැට ගසා තිබුණි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එහිදී පෙර නබිවරුන්ට ඉමාම් ලෙස හිඳ සලාතය මෙහෙය වූහ. මස්ජිදුල් අක්සාවේ (බෛතුල් මුකද්දිස්) සිට මිඃරාජ් ගමන ආරම්භ කළෝ ය.

මෙම ගමනේ දී සෑම අහස් තලයක දී ම නබිවරුන් මුණගැසුණහ. ඔවුන් විසින් එතුමා පිළිගෙන සුබ පතන ලදි. පිළිවෙළින් ආදම් අලෛහිස් සලාම්, ඊසා අලෛහිස් සලාම්, යූසුෆ් අලෛහිස් සලාම්, ඉද්රීස් අලෛහිස් සලාම්, හාරූන් අලෛහිස් සලාම්, මූසා අලෛහිස් සලාම්, ඉබ්රාහීම් අලෛහිස් සලාම්, යන නබිවරුන් හමු වූහ. අහස් හතක් පසු කර ''සිද්රතුල් මුන්තහා'' වට පැමිණ අල්ලාහ්ව හමු වූහ. අල්ලාහ් එතුමාට දිනක දී 50 වරක් ඉටු කරන සලාතය තෑගි වශයෙන් පිරිනැමුවේ ය. නැවත එන අතර තුර මූසා අලෛහිස් සලාම් තුමාගේ අදහසට අනුව නැවත අල්ලාතආලා වෙත ගොස් එය පිළිවෙළින් අඩු කර පස් වේල් සලාතය තෑගි වශයෙන් රැගෙන පැමිණියහ.

මෙම ගමනේ දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට ස්වර්ගයේ සැප සම්පත් ද නිරයේ වේදනාව ද පෙන්වා දෙන ලදි. ජිබ්රීල් අලෛහිස් සලාම් තුමා එතුමාට ඒවා පැහැදිලි කර දුන්නේ ය.

පසු දින උදෑසන අබුබක්ර් (රළි) තුමාට මෙම සිදුවීම් පිළිබඳ ව සැළවූ වහා ම කිසිදු පැකිලීමකින් තොරව වහා පිළිගත්තේ ය. එහෙයින් එතුමාට සිද්දීක් (සත්‍ය ස්ථිර කරන්නා) යන ගෞරව නාමය හිමි විය. එනමුදු කාෆිර්වරු එය විහිළුවට ලක් කළහ. ප්‍රශ්න පිට ප්‍රශ්න විමසුවෝ ය. එවිට, නිශ්චිත එම රාත්‍රියේ දී ස්ථාන කිහිපයක හමු වූ ව්‍යාපාරික කණ්ඩායම් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කළ විට ද මස්ජිදුල් අක්සාවෙහි හැඩය පිළිබඳව නැගූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ විට ද ඔවුහු එයින් තෘප්තිමත් නොවූහ.

මිඃරාජ් ගමන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ මුඃජිසා අතරින් එකක් ලෙස තත්ත්වය උසස් කරලීමට ද තුඩු දුන්නේ ය. තව ද එය ඊමානය ශක්තිමත් කිරීමට හා මනසට සැනසුමක් ද ලඟා කිරීමට හේතු විය. එමගින් උසස් අරමුණු හා සාර්ථකත්වයක් ගෙන හැර දක්වන ලදි.

**පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන**

الْحَجَرُ الأَسْوَدُ    الْحِرَاءُ    الإِسْرَاءُ    الْمِعْرَاجُ    سِدْرَةُ الْمُنْتَهَى    اِقْرَأْ

## අභ්‍යාස

අ. කෙටි පිළිතුරු සපයන්න.

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා රාත්‍රියේ දී රැඳී සිටි ගුහාවේ නම කුමක් ද?
2. "නාමූසුල් අඃලම්" යනු කවුරුන් ද?
3. ප්‍රථමයෙන් ම ඉස්ලාමය වැළඳගත් කාන්තාව කවුරුන් ද?
4. 'අල් ඉස්රා' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
5. 'සිද්රතුල් මුන්තහා' පිහිටියේ කොහි ද?
6. 'බුරාක්' යනු කුමක් ද?
7. මස්ජිදුල් අක්සා පිහිටා ඇත්තේ කොහි ද?
8. අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාට "සිද්දීක්" යන නාමය ලැබුණේ කවදා ද?
9. වාර 50 සලාතය, පංච කාලයට අඩු කර ගැනීමට හේතු වූයේ කවුරුන් ද?
10. ප්‍රථම වහී පහළ වූ විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා නබි යැයි තහවුරු කළ විද්වතා කවුරුන් ද?

ආ. පිළිතුරු සපයන්න.

1. ජිබ්රීල් (අලෛ) තුමා "කියවන්න" යැයි ප්‍රකාශ කළ විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා එකවර ම පාරායනා නොකිරීමට හේතු සඳහන් කරන්න.
2. අල් ඉස්රා ගමනේ දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ලැබූ අත්දැකීම් කෙටියෙන් පවසන්න.
3. අල් ඉස්රා හා අල් මිහ්රාජ් අතර ඇති වෙනස්කම් මොනවා ද?